රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 127

මගේ අංකය: 2/9/771 (එච්).
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1978 සැප්තැම්බර් මස 22 වැනි දින දී ය.

සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රජයේ සංස්ථා ප්‍රධානීන් වෙත යි.

## 1978 සැප්තැම්බර් මස 28 වැනි දින වැඩ වර්ජනය.

අංක 125 හා 126 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට වැඩිමනත්වය යි. රජය පහත සඳහන් තීරණවලට එළඹ ඇත:

(අ) මහවැලි සංවර්ධන ශ්‍රමදාන වැඩ කටයුතු සඳහා 1978 සැප්තැම්බර් මස 28 වැනි දින වෙනුවෙන් නිවාඩු අනුමත කරනු ලැබ සිටින රජයේ නිලධාරීන්, පළාත් පාලන සේවකයන් හා රජයේ සංස්ථාවලත් වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවලත් සේවකයන් මෙදින ඔවුන්ගේ කාර්යාලවල රාජකාරිය සඳහා වාර්තා කළ යුතු වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කළ යුතුය;

(ආ) 1978 සැප්තැම්බර් මස 28 වැනි දින කිරීමට යෝජිත සංකේත වැඩ වර්ජනය සම්බන්ධයෙන් කලින් සිට රාත්‍රියේ ස්වකීය කාර්යස්ථානවල නැවතී සිටීමට අදහස් කරන රජයේ නිලධාරීන්ට, පළාත් පාලන සේවකයන්ට හා රජයේ සංස්ථාවලත් වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවලත් සේවකයන්ට පහසුකම් සැලසිය යුතුය. ගරු ඇමතිවරුන් මේ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් දෙනු ඇත.

(ඇ) කඩාකප්පල්කාරී ක්‍රියා කිසිවක් සිදු නොවන බවට වග බලා ගනු වස් කල් තියා නිසි පියවර ගත යුතුය.

2. අදාල සියලු දෙනා ම මීට අනුකූලව ක්‍රියා කිරීම ගැන කරුණාකර වග බලාගනු මැනවි.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

වී/22.